# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2208/15 – 2020 දෙසැම්බර් 30 වැනි බදාදා – 2020.12.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (බී. එල්. පී. සරත් කුමාර මයා ඇතුළු සේවකයින් 15 දෙනා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජයකන්ටේනර් ටර්මිනල්ස් සමාගම, අංක 69, චෝල්ස් පටුමග, බ්ලුමැන්ඩල් රෝඩ්, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දෙහිඕවිට, මල්වරුසාව, නීතිඥ ප්‍රවීන් ප්‍රේමතිලක මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

1A – G 33382 – 35 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2018/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (බී. එල්. පී. සරත් කුමාර මයා ඇතුළු සේවකයින් 15 දෙනා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජයකන්ටේනර් ටර්මිනල්ස් සමාගම, අංක 69, චෝල්ස් පටුමග, බ්ලූමැන්ඩල් රෝඩ්, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

''ජය කන්ටේනර් ටර්මිනල් ලිමිටඩ් හි සේවය කරන බී. එල්. පී. සරත් කුමාර මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 15 දෙනා හට 2018.06.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි බහුවිධ කාර්යය ක්‍රියාකරු (මෙහෙයුම්) සහ විවිධ කාර්ය සහායක යන තනතුරු නාම ලබා දීමෙන් ද එමගින් ඔවුන් පෙර ඉටුකළ රාජකාරීන්ට වඩා වෙනස් රාජකාරීන් පැවරීමෙන් ද එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

1. බී. එල්. පී. සරත් කුමාර
2. ආර්. යූ. වීරසිරි
3. කේ. ඩී. එස්. හේමචන්ද්‍ර
4. ජේ. පී. එම්. කුමාරසිරි
5. ඩබ්. ඩබ්. එම්. ඒ. ජේ. මැදවත්ත
6. ජේ. ඒ. ආර්. එස්. පෙරේරා
7. ඒ. ජී. චමින්ද
8. ඊ. එම්. ඩී. ජේ. වීරසිංහ
9. එච්. පී. මහේෂ් වීරසිංහ
10. එච්. එම්. අයි. පුෂ්පකුමාර
11. ඒ. වයි. පෙරේරා
12. කේ. ගුණසේකර
13. නියෝමාල් ප්‍රනාන්දු
14. එස්. කේ. සී. පෙරේරා
15. එම්. ජේ. බර්නාඩ්

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 58

---

මගේ අංකය: IR/COM/02/2016/157.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2017.12.26 වැනි දින අංක 2051/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ (සේවකයන් 20 දෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, බම්බලපිටිය, කොළඹ 04.

අතර පවත්නා 2017.11.22 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.12.19 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ (සේවකයන් 20 දෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, බම්බලපිටිය, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, යටිවාවල, අරලිය උයන, 'මිගදාය', අංක 339/01/ඩී/2, එල්. ආර්. සුමතිපාල මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/157.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ (සේවකයන් 20 දෙනෙක් වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, අංක 27, මෙල්බන් ඇවනියු, බම්බලපිටිය, කොළඹ 04.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත කර්මාන්ත ශාලාවේ සේවය කළ/සේවය කරන පහත නම් සඳහන් සේවකයින් 20 දෙනාට රජය විසින් නිකුත් කර ඇති අංක 01/2013 දරන චක්‍රලේඛයට අනුව වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ සිදුව තිබේ නම් ඔවුනට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳව වේ.''

1. එන්. ඩී. එම්. කරුණාතිලක
2. ජී. එම්. එස්. බණ්ඩාර
3. ආර්. විමලතිස්ස
4. ඩබ්. එම්. ජයතිලක
5. ඩී. එම්. ජයසිංහ
6. එල්. එන්. අමරදාස
7. ජී. එන්. ශාන්ත
8. එම්. කේ. ලීලාරත්න
9. ආර්. ඒ. ලෙස්ලි අමරසිංහ
10. එල්. බී. පාලිත
11. ආර්. එම්. ඥාණරත්න
12. ඩී. එම්. එස්. ආනන්ද
13. ඒ. ජී. විජේතුංග
14. එම්. එම්. සෝමදාස
15. පියසිරි ලංකාපුර
16. ඩී. එම්. කුලතිලක
17. පුෂ්ප කාන්ත ගුණවීර
18. ආර්. එම්. පොඩිමැණිකේ
19. ආර්. එම්. කරුණාරත්න
20. ඒ. ජී. සිරිසේන

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 59

---

මගේ අංකය: IR/COM/01/2018/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. පද්මිණී ප්‍රනාන්දු මිය, අංක 02/02, දහම් පාසැල් මාවත, වැවල - පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිටිපන, හෝමාගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. පද්මිණී ප්‍රනාන්දු මිය, අංක 02/02, දහම් පාසල් මාවත, වැවල - පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිට්පන, හෝමාගම.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ 2011.01.03 සිට 2016.01.03 දක්වා මූල්‍යාධිකාරී ලෙස සේවය කළ පී. පද්මිණී ප්‍රනාන්දු මියගේ ස්ථිර නොකිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 60

මගේ අංකය: IR/COM/01/2019/01.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.09.27 වැනි දින අංක 2142/89 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.09.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එන්. වීරතුංග මිය, අංක 104/16, බෞද්ධාලෝක මාවත, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

අතර පවත්නා 2019.09.16 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.09.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/01.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එන්. වීරතුංග මිය, අංක 104/16, බෞද්ධාලෝක මාවත, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර දකුණ, රාමනායක මාවත, දෙවන පටුමග, අංක 49/87, නීතිඥ එම්. කේ. ඒ. වී. නිලමනී මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/01.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. එන්. වීරතුංග මිය, අංක 104/16, බෞද්ධාලෝක මාවත, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ගමනාගමන කොමිෂන් සභාව, අංක 241, උද්‍යාන පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවය කරන ඩී. එන්. වීරතුංග මහත්මිය II ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරට බඳවාගෙන ඉන් පසුව ඇයගේ වැටුප් අඩු කිරීම හා තනතුරට හිමි වරප්‍රසාද අහිමි කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 82

---

මගේ අංකය: IR/COM/02/2017/82.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2017.12.26 වැනි දින අංක 2051/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.19 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.
2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම, අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර පවත්නා 2017.12.06 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.12.19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/82.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.
2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම, අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, කැප්පෙටිපොල පාර, අංක 169/1 බී 2, නීතිඥ එච්. එම්. විජිත පීරිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/82.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, අංක 457, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, 12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, අංක 33, පාර්ක් වීදිය, කොළඹ 02.
2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම, අංක 333 ඒ, නුවර පාර, කිරිල්ලවල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

i. සේවකයින්ට ප්‍රසාද දීමනා ගෙවීමේ දී වැඩ කරන දින ගණන නිවැරදිව පදනම් කරගෙන හා අනුමත නිවාඩු දින ඇතුළත්ව ප්‍රසාද දීමනා නොගෙවීම.

ii 2016 වර්ෂයට වැටුප 30% කින් වැඩි කිරීම යන ඉල්ලීම් සේව්‍යයා විසින් ඉටු නොකිරීම සහ,

iii සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමේ දී පොදු ක්‍රමයක් අනුගමනය නොකර ගොවිපලවලට අනුයුක්ත විවිධ නිලධාරීන් විසින් සේවකයන් සම්බන්ධ විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් සේවකයින් හට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවා ද? යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 83

---

මගේ අංකය: IR/COM/02/K/2015/12.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. ඩබ්. පද්මකුමාර මයා, අංක 570/1ඒ, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, අංක XB-10-1-2, ඩී. ජී. කේ. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/K/2015/12.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එච්. ඩබ්. පද්මකුමාර මයා, අංක 570/1ඒ, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා සෝල්ට් ලිමිටඩ් හි 227/4ඒ, නිර්මාණ මාවත, නාවල පාර, නුගේගොඩ කාර්යාලයේ විශේෂ ශ්‍රේණියේ මුදල් අයකැමි වශයෙන් සේවයේ යෙදී සිටි එච්. ඩබ්. පද්මකුමාර මහතා 2007.12.28 වැනි දින වැටුප් රහිතව වැඩ තහනමකට ලක්වී පසුව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව 2009.02.02 වැනි දින නැවත සේවයේ පිහිට වූ නමුත් වැඩ තහනම් කර සිටි කාලය සඳහා හිඟ වැටුප් හා වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා ලබා නොදීම මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 84

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.